**උතුරු පළාතේ තිරසාර ධීවර සංවර්ධනය සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය - 2017**

උතුරු පළාතේ තිරසාර ධීවර සංවර්ධනය සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා වන ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 09 සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 මාර්තු 17 දින එළඹි අංක 6011 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ I ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතන හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් තිරසාර උපයෝජනය සඳහා ධීවර වරාය, නැංගුරම් ස්ථාන හා ගොඩබෑමේ ස්ථාන පිළිබඳ විස්තරාත්මක සැලැස්මක් සිදුකිරීම වේ. ණය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 242.43 කට සමාන එජඩො මිලියන 1.59 ක් වන අතර ඉන් රු. මිලියන 198.11 කට සමාන එජඩො මිලියන 1.30 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කරනු ලැබේ. ව්‍යාපෘතියේ කාර්යයන් 2017 මාර්තු 20 දින ආරම්භ කරන ලද අතර 2018 ජුනි 01 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වුයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යය සාධනය

---------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදන 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යායනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| ------ | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 1.30 | 198.11 | 190.00 | 0.08 | 12.89 |
| ශ්‍රීලංර | 0.29 | 44.32 | 42.00 | 0.04 | 6.31 |
| | ------ | ------- | ---------- | ------- | ------ |
| එකතුව | **1.59** | **242.43** | **232.00** | **0.12** | **19.20** |

### 3.2 භෞතික ප්‍රගතිය

----------------

ව්‍යාපෘතියේ පාලන අත්පොතේ 45 පරිච්ඡේදය අනුව, විස්තරාත්මක සැලසුමේ කෙටුම්පත් වාර්තාව 2017 ඔක්තෝබර් 30 දින ඉදිරිපත් කල යුතු වූ අතර, එහි අවසන් වාර්තාව 2017 නොවැම්බර් 30 දින ඉදිරිපත් කල යුතුව තිබුණි. කෙසේ වුවද, අදාල සැලසුම සම්පූර්ණකර නොතිබූ අතර, එහි වාර්තාව 2017 දෙසැම්බර් 31 දිනය වන විට අවසන් කර නොතිබුණි.

### 3.3 මූල්‍ය පාලන අඩුපාඩු

-----------------------

ව්‍යාපෘතියේ පාලන අත්පොතේ 24 වන වගන්තිය, මුදල් රෙගුලාසි අංක 134 (4) සහ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ අවශ්‍යතා පරිදි ව්‍යාපෘති කාර්යයන් අභ්‍යන්තර විගණනයට යටත් කර නොතිබුණි.

### 3.4 අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම්

---------------------------------------

ව්‍යාපෘති අධ්‍යක්ෂක හා ධීවර වරාය සංස්ථා සභාපති 2016 මාර්තු 22 හා 2016 මැයි 10 දින ඇතුලත්වූ ගිවිසුම පරිදි ව්‍යාපෘතිය විසින් රු.මිලියන 3.16 ක් වැයකර සමාලෝචිත වර්ෂය තුල පේදුරුතුඩුවේ හා පේසාලේ සිදුකර තිබූ බැතිමෙට්රික් (bathymetric) සහ ටොපෝග්‍රැෆික(Topographic) සමීක්ෂණ ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීම සම්බන්ධයෙන් නොවුනි.